## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ ගිනි නිවීම් ඒකකයේ ගිනිභට තනතුර සඳහා බඳවා ගැනීම

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව තුළ දැනට පුරප්පාඩුව පවතින ගිනිභට තනතුරට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. තනතුරු නාමය - ගිනිභට
(තනතුර ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිතයි)

02. වැටුප් පරිමාණය සහ වැටුප් කේත අංකය
- වැටුප් පරිමාණය -රු.49550 - 7 x540 - 27 x670 - 71420/-
- වැටුප් කේත අංකය -RS 1-2025

03. පුරප්පාඩු සංඛ්‍යාව -24

04. අධ්‍යාපන සුදුසුකම්

-එකවරකදී සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ඇතුලුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය විෂයයන් හයකින් සමත්ව තිබිය යුතු අතර එම අවස්ථාවේදීම හෝ තවත් එක් අතිරේක අවස්ථාවකදී විද්‍යාව හා ඉංග්‍රීසි භාෂාව විෂයයන්ද සමත්ව තිබිය යුතුය.

05. කායික සුදුසුකම්

i. උස සෙ.මී.162 කට නොඅඩු සහ ජෛව ස්කන්ධ දර්ශකය නියමිත පරිදි තිබිය යුතුය.
(ජෛව ස්කන්ධ දර්ශකය 18.5 සිට 24 දක්වා විය යුතුය)

ii. සෑම අපේක්ෂකයකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් , තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

iii. දෘෂ්ඨිය පිළිබඳ අවශ්‍යතාවයන් - උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච රහිත ඇස් පෙනීම අවම වශයෙන් 6/6 සහ 6/12 අතරද , වර්ණ පෙනීමද සාමාන්‍ය විය යුතුය.

iv. කෘතිම ශාරීරික වෙනස්කම් කර නොතිබිය යුතුය.

06.වෙනත්

i. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුයි.

ii. අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර තුනක් (03) අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය තිබිය යුතුය.

iii. අවිවාහක පිරිමි අයෙකු විය යුතුයි.

iv. යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර නීති විරෝධී ක්‍රියාවන්ට සම්බන්ධ නොවූ අයෙකු බව පොලිස් වාර්තාවකින් සනාථ කළ යුතුය.

v. තනතුරට බඳවා ගැනීම සඳහා නියමකර ඇති සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුයි.

07.වයස

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු අවුරුදු 24 නොවැඩි විය යුතුයි.

08.බඳවා ගැනීමේ ක්‍රමය

I. ලිඛිත පරීක්ෂණයෙන් හා වෘත්තිය (ප්‍රායෝගික ) පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සඳහා ආධුනික ගිනිහටයින් වශයෙන් තෝරා ගනු ලැබේ.

II. පුහුණුව ආරම්භ කිරීමට පෙර සියලුම ආධුනික ගිනිහටයින් කායික, මානසික යෝග්‍යතාවය තහවුරු කිරීම සඳහා වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ.

III. පුරප්පාඩු සඳහා තෝරාගන්නා අයවලුන් එක් අවුරුදු ගිනිහට පුහුණු පාඨමාලාව හැදෑරිය යුතුය. පුහුණු කාල සීමාව තුළ දී වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායක නොවන හෝ අපේක්ෂිත රැකියා මට්ටමට ළඟා නොවන ආධුනික ගිනිහටයින් කිසිම වන්දියකින් තොරව පුහුණුවෙන් ඉවත් කරනු ලැබේ.

IV. සාර්ථකව අදාළ පුහුණුව අවසන් කරන ආධුනික ගිනිහටයින් ගිනිහට තනතුර සඳහා ස්ථිරව බඳවා ගනු ලැබේ. පුහුණු කාලසීමාව ස්ථිර සේවා කාලය සඳහා ගණනනය කරනු ලබන අතර අදාළ වැටුප් පරිමාණයේ දෙවන පියවරේ තබනු ලැබේ.

V. පුහුණු කාලසීමාව තුළ මාසිකව රු.10,000/- ක දීමනාවක් ගෙවනු ලැබේ.

VI. පුහුණු කාලසීමාව තුළ දී කිසිම ආධුනික ගිනිහටයෙකුට විවාහ වීමට අවසර දෙනු නොලැබේ.

VII. පුහුණුවට තෝරා ගන්නා ලද ආධුනික ගිනිහටයින් ස්ථිර තනතුරට පත්කිරීමෙන් අනතුරුව පත් කළ දින සිට වසර 05 ක කාලසීමාවක් අදාළ පළාත් පාලන ආයතනයේ සේවය කරන බවට පත් කිරීමේ බලධරයා සමඟ රු.500,000/- ක වටිනාකමකින් යුතු බැඳුම්කරයක් පුහුණුව ආරම්භ කරන අවස්ථාවේදී අත්සන් කළ යුතුය.

VIII. ආධුනිකයාගේ අභිමතය පරිදි පුහුණුවට වැය වූ සියලුම වියදම් ආයතනය වෙත ගෙවීමට කටයුතු කළ යුතුය.

ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය

| විෂය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය<br>ජාතික කලාපීය හා ලෝකයේ විවිධ සංවිධාන පරිසරයන් තුළ පවතින සාමාජීය, සංස්කෘතික, අධ්‍යාපනික, විද්‍යාත්මක, දේශපාලනමය, ආර්ථික හා අනෙකුත් අදාළ සාධකයන් සම්බන්ධව මෙන්ම විද්‍යාත්මක හා කාර්මික සංවර්ධන සම්බන්ධයෙන් ඇති දැනුම, තර්කන ශක්තිය, ගණිත කුසලතාවයන් , තාර්කික තීරණ ගැනීම හා කාලය කළමනාකරණය කිරීම , පරීක්ෂා කිරීම සඳහා සකස් වූ ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 | 100 | 40 |

වෘත්තීය පරීක්ෂණයේ විෂය ක්ෂේත්‍රය

| විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| දුරා ගැනීමේ හැකියාව<br>i.දිවීම (කිලෝමීටර 01ක දුර දිවීමට ගතවන අවම කාලය අනුව ප්‍රමුඛතාවය)<br>ii.ඩිප්ස් ගැසීම (නිවැරදි ව ඩිප්ස් 25ක් ගැසීමට ගතවන අවම කාලය)<br>iii.බර ඔසවාගෙන යාම | අදාල වන පරිදි | 60 | 36 |
| සමබරතාව<br>i.ඉනිමගේ යාම<br>ii.කඹයෙන් බැසීම | අදාල වන පරිදි | 40 | 24 |

ii. සාර්ථකව ආධුනික ගිනිභට පුහුණුව අවසන් කරන ආධුනිකයින් ගිනිභට තනතුරට ස්ථිරව බඳවා ගනු ලැබේ.

09. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අකාරය

ගිනිභට තනතුරට බඳවා ගැනීම සම්බන්ධ අනෙකුත් සියලුම තොරතුරු සහ කොන්දේසි ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ වෙබ් අඩවියේ (kotte.mc.gov.lk) දැක්වෙන් අතර එහි සඳහන් ආකෘතිය අනුව අයදුම්පතක් පිළියෙල කර 2026.09.01වන දින හෝ එදිනට ලැබෙන සේ "නාගරික කොමසාරිස්, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව,අංක 06, නාවල පාර, රාජගිරිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ ඉදිරිපස ඉහළ වම් කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කල යුතුවේ. නියමිත දිනට පසුව ලැබෙන සහ මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර නොමැති අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

නාගරික කොමසාරිස්
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ

...................................................... තනතුර සඳහා ආදර්ශ අයදුම්පත්‍රය.

01. අ. මුලකුරු සමග නම : ..........................................................................................................

ආ. මුලකුරු වලින් හැඳින්වෙන නම් :..........................................................................................

02. අ. උපන්දිනය ............................................................................................................................

ආ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවු. ................ මාස : ............ දින .........................

03. ජාතික හැදුනුම්පත් අංකය : .................................................................................................................

04. විවාහක / අවිවාහක තත්ත්වය : .........................................................................................................

05. ස්ථිර ලිපිනය ...........................................................................................................................................

06. දුරකථන අංකය : ......................................................................................................................................

07. අ. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : .........................................................................................................

ආ. පදිංචි ස්ථානය අයත් ග්‍රාම නිලධාරි වසම සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :

..............................................................................................................................

08. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට බස්නාහිර පළාත තුළ පදිංචි කාල සීමාව : ........................................

09. උස අඩි : ............................................................ අඟල් ........................................................

10. බර : .......................................................................................................................................................

11. අධ්‍යාපන සුදුසුකම්

ප්‍රතිඵල ලේඛනයේ ඡායා පිටපතක් අමුණන්න.

අ.පො.ස. (සා.පෙළ) විභාගය : විභාග අංකය ................................වර්ෂය ...............................................

| විෂය | සාමාර්ථය | විෂය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

12. වෘත්තියසුදුසුකම් : ..........................................................................................................

13. වෙනත් සුදුසුකම් : ...........................................................................................................

14. ඔබ කිසියම් සපරාධිවරදක් සම්බන්ධයෙන් කෙදිනක දී හෝ උසාවියකදී වරදකරුවෙකු වී තිබේද ? ඔව්/නැත

(වරදකරුවෙකු වී තිබේනම් එහි ස්වභාවය හා ලද දඩුවම් පැහැදිලිව සදහන් කරන්න.)

...........................................................................................................................................

...........................................................................................................................................

15. ඔබ රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ / සංස්ථා / වෙනත් සේවාවක සේවයේ යෙදී සිට එම සේවයෙන් පහකළ හෝ ඉල්ලා අස්වීද යන වග / (එසේ නම් ඊට හේතු )

..........................................................................................................................................................

..........................................................................................................................................................

ඉහත සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බවට අනාවරණය වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බවත්, සහ පත්වීම් ලැබීමෙන් පසු එය අනාවරණය වුවහොත් කිසිදු වන්දියකින් තොරව මා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවද දනිමි.

............................................ ....................................................

දිනය අයදුම් කරුගේ අත්සන

දැනට රාජ්‍ය සේවයේ හෝ කිසියම් පළාත් රාජ්‍ය සේවයක හෝ සංස්ථාවක සේවයේ නියුතු අයදුම්කරුවන් පහත දැක්වෙන සහතිකය සමග අයදුම්පත්‍රය එවිය යුතුවේ.

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ...................................................... නැමැති අයදුම්කරු ........................ වැනි දින සිට මෙම ආයතනයේ සේවය කරනු ලබන අතර වැඩ හා හැසිරීම නිරන්තරයෙන්ම සතුටුදායක බවත්, ඉහත සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවත් සහතික කරමි. ගිනිහට තනතුර සඳහා මෙම අයදුම්කරු තොරාගනු ලැබුවහොත් ඔහු මෙම ආයතනයේ සේවයෙන් මුදා හරින බව නිර්දේශ කරමි.

.........................................................

ආයතනයේ ප්‍රධානියාගේ අත්සන

(නිල මුද්‍රාව )

දිනය: ......................................................................................................................

සහතික කරන අයගේ සම්පූර්ණ නම ................................................................................

තනතුර .....................................................................................................................

ලිපිනය .....................................................................................................................